## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2011

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 05 ට අනුව ආදායම් හා වියදම් අයිතමයන් ප්‍රමාණාත්මක වන විට ගිණුම්වල ඒවා වෙනමම වාර්තා කළ යුතු වුවත් 2011 වර්ෂයේ බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම හා වියදම එකිනෙකට හිලව් කර ශුද්ධ ප්‍රතිඵලය වූ රු.1,807,707 අනෙකුත් ආදායම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ආයතනය වෙත 2010 ට පෙර ලැබී තිබුණු රු.119,992,689 ක්වූ ප්‍රදාන ගිණුම්ගතකර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ආයතනය ක්ෂය වලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය තීරණය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 ට පටහැනිව කටයුතු කර තිබුණි.

1.2.3 **ගිණුම්කරන අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සේවක පාරිතෝෂිත වෙන්කිරීම් රු. 66,597 කින් අඩුවෙන් ගිණුම් ගත කරම හේතුවෙන් ශුද්ධ ඌනතාවය හා දිගුකාලීන වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ආ) අත්පත් කරගත් වාහනයක් වෙනුවෙන් අයතනය සතු පැරණි වාහනයක් විකුණා ලද රු.1,231,776 ක්වූ මුදල මහ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම ගිණුම්ගත කිරීමේදි ඒකාබද්ධ ප්‍රාග්ධන ගිණුමට හර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

අවුරුදු 2-3 කාලසීමාවක සිට පැවත එන රු.48,750 ක් වූ ලැබිය යුතු ශේෂයන් ආයතනය විසින් අයකරගෙන නොතිබුණි.

1.2.5 <u>නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම</u>

විගණනයේදි නිරික්ෂණය වූ නිති, රීති, රෙගුලාසි ආදියට අනුකුල නොවීම් පහත දැක්වේ.

| <u>නීති ,රීති ,රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) 1979 අංක 45 දරණ ජාතික වැව්ලි කළමනාකරණ පනතේ 6 වගන්තිය | (අ) අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සාමාජිකයින් 15 දෙනෙකුගෙන් නියෝජනය විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය 12ක් වී තිබුණි. |
| | (ආ) විෂය භාර අමාත්‍යවරයා විසින් පාලක සභාවට වෘත්තිය සමිති නියෝජනය වන පරිදි සාමාජිකයන් දෙදෙනකු පත්කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 104 | රු. 154,875 ක්වූ වාහන හානි සම්බන්ධව විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි. |
| (ඇ) අංක පී ඊ ඩී / 27 හා 2005 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත අවසන් ගිණුම් සමග විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු රු.8,500,000 ක භාණ්ඩාගාර ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු. 4,361,708 ක ඌනතාවයක් වූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ලැබුණු රු.10,505,200 ක භාණ්ඩාගාර ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසුව ඉකුත් වර්ෂයේ රු.1,511,302 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 5,873,010ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී රජයේ ප්‍රදාන

අඩුවීම හා මෙහෙයුම් වියදම් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඇඩි පිරිහීමකට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උපයාගත් ආදායමෙන්, 62% ක මෙහෙයුම් වියදම් ආවරණය කරගැනීමට හැකි වී තිබුණි.

(ආ) ආයතනයේ සමස්ථ ආදායමින් 70 % මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගනු ලැබූ ආදායම් වලින් ආවරණය වී තිබුණු අතර ශේෂය වූ 30 % රජයේ ප්‍රදානයන්ගෙන් ආවරණය වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

**සමාලෝචිත වර්ෂයේ පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය**

2011 වර්ෂය වෙනුවෙන් සැලසුම් කරන ලද පාඨමාලා අතරින් තථ්‍ය වශයෙන් පැවැත්වූ පාඨමාලාවල ප්‍රගතිය පහත දැක්වේ.

| 2011 වර්ෂය වෙනුවෙන් සැලසුම් කරන ලද පාඨමාලාවේ නම | සැලසුම් කල ප්‍රමාණය | තථ්‍ය ප්‍රමාණය | සැලසුම් ගත ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| අධ්‍යාපන හා වෘත්තීය වැඩසටහන් | 18 | 14 | 77 |
| තේ හා රබර් සඳහා තාක්ෂණ සංවර්ධන | 13 | - | 0 |

| | | | |
|---|---|---|---|
| වැඩසටහන් | | | |
| කළමනාකරණ සංවර්ධන වැඩසටහන් | 05 | - | 0 |
| කුසලතා සංවර්ධන වැඩසටහන් | 08 | 03 | 37.5 |
| කුඩා වතු හිමියන් සඳහා පුහුණු පාඨමාලා | | | |
| තේ, රබර්, පොල්, උක් වගාව | සැලසුම් කර නොතිබුණි | 74 | |
| විශේෂ පුහුණු වැඩසටහන් | 28 | 10 | 36 |
| වගාකරුවන් පුහුණු කිරීමේ පාඨමාලා | 03 | 02 | 67 |
| විදේශ පුහුණු වැඩසටහන් | 01 | - | 0 |
| ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් | 03 | - | 0 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපාර සංවර්ධන වැඩසටහන්, විදේශ පුහුණු වැඩසටහන්, කළමනාකරණ සංවර්ධන වැඩසටහන් සහ තේ හා රබර් සඳහා තාක්ෂණ සංවර්ධන වැඩසටහන් සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කළද කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ආ) කුසලතා සංවර්ධන වැඩසටහන් හා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වා තිබුණේ සැලසුම් ගත ප්‍රමාණයෙන් 37.5% ක් පමණි.

3.2 <u>වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පිඑඩී 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ ප්‍රයෝජනය සඳහා රු.1,224,380 කට

මිලදී ගෙන තිබූ සෝනි වර්ගයේ වීඩියෝ කැමරාව රේබීය අමාත්‍යාංශයේ ප්‍රයෝජනයට ලබාදී තිබුණි.

(ආ) ආයතනයට අයත් සේවකයින් තිදෙනෙකු රේබීය අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. එකී සේවකයන් තිදෙනා වෙනුවෙන් ආයතනය විසින් වැටුප් හා දීමනා ලෙස දෙසැම්බර් මස රු. 28,578 ක් ගෙවා තිබුණි.

## 3.3 කාර්ය මණ්ඩලය

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන අනුමත මාණ්ඩලික තනතුරු 4 ක් පුරප්පාඩුව පැවතියද අතියම් පදනම මත මාණ්ඩලික නොවන හා කණිෂ්ඨ තනතුරුවලට නිලධාරීන් 10දෙනෙකු බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනයට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| මාණ්ඩලික | 11 | 07 | 04 |
| මාණ්ඩලික නොවන | 14 | 14 | - |
| කණිෂ්ඨ | 13 | 13 | - |
| | 38 | 34 | 04 |

# 4 . ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තුගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේදී 37.39% සිට 100 % දක්වා පරාසයන් තුල සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2009 හා 2010 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2012 මැයි 31 දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත වී නොතිබුණි.

## 5 පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වාහන උපයෝජනය

(ඇ) කාර්ය මණ්ඩලය

(ඉ) පාඨමාලා ගාස්තු